ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 25 April, 2020

ඊ-තැපැල ඔස්සේ

ච.ද. වික්‍රමරත්න මහතා,
පොලිස්පතිතුමන් (වැ. බ.)
පොලිස් මුලස්ථානය
කොළඹ 01.

<u>ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුල අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මත සීමා පැනවීම - නීත්‍යානුකුල තුලනයක අවශ්‍යතාවය.</u>

මෑත කාලීනව සමාජ මාධ්‍ය ඔස්සේ සිදුකරන ලද ප්‍රකාශයන් ආශ්‍රිතව, විශේෂයෙන්ම කොවිඩ් - 19 වෛරසය පැතිරවීම පිළිබඳව කරන ලද ප්‍රකාශයන් ආශ්‍රිතව, පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම් සමුදායක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලබයි.

2020 අප්‍රේල් මස 01 වන දිනැතිව පොලිස් දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශය විසින් සියලුම මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත කොවිඩ් - 19 වෛරසය පැතිරීම මැඩ පැවැත්වීම උදෙසා කටයුතු කරන රාජ්‍ය ආයතන වලට එරෙහිව අන්තර්ජාලය ඔස්සේ අසත්‍ය හෝ ද්වේශසහගත තොරතුරු පල කරන පුද්ගලයන්ට එරෙහිව දැඩි නීතිමය පියවර ගන්නා බව සඳහන් කර නිකුත් කරන ලද ලිපියකින් අනතුරුව මෙම අත්අඩංගුවට ගැනීම්වල වර්ධනයක් මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. නිලධාරීන්ට එරෙහිව සිදු කරන විවේචනයන් කිසිසේත් නොඉවසන බව මෙම ලිපියේ පැහැදිලි පණිවිඩය වේ.

ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතියක් තුල සහතික කොට ඇති අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සහ ඒ හා සමාන අනෙකුත් අයිතීන් මත සීමාවන් පැනවීම උදෙසා ගන්නා ක්‍රියාමාර්ග හදිසි කාලවකවානුවක් තුලදී වුවද නීත්‍යානුකුල විය යුතු බව පෙන්වා දීම අප කොමිෂන් සභාවේ යුතුකම වේ. මෙම අවස්ථාවට අදාළ නීතිමය රාමුව ශ්‍රී ලංකා ව්‍යවස්ථාව සහ ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් තුල අන්තර්ගත වේ. එම නීතීන්ට අනුව අයිතිවාසිකම් මත පනවන සීමාවන් නීත්‍යානුකුලභාවය, සමානුපාතිකත්වය (එනම් පනවන සීමාව මැඩ පවත්වන තර්ජනයට සමානුපාතික විය යුතු බව) සහ නොවෙනස්ව සැලකීමේ පරීක්ෂණයන්ට අනුකුල විය යුතු වේ. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ හා සබැඳි ඉතා ප්‍රබල නඩු තීන්දු නීති රාමුවක් ප්‍රකාශයට පත් කොට ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් මෙම කොමිෂන් සභාව පහත කරුණු ඔබගේ අවධානයට ලක් කිරීමට කැමැත්තෙමු. 1996 අංක 21 දරණ කොමිෂන් සභා මව් පනත යටතේ පැවරී ඇති බලතල සහ කාර්යභාරයන්ට අනුකුලව මෙසේ දක්වා සිටිමු;

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

1. වැරදි තොරතුරු ප්‍රචාරණය කිරීමට එරෙහිව සිදු කරන අත්අඩංගුවට ගැනීම්

මුළු රටම පෙර නොවූ ආකාරයේ මහජන සෞඛ්‍ය අර්බුධයකට මුහුණ පා සිටින අවස්ථාවකදී මහජනතාව අතර සංත්‍රාසයට හේතුවන ආකාරයේ සහ මහජන සෞඛ්‍ය සහ මහජන සාමයට ප්‍රබල තර්ජනයක් එල්ල කල හැකි ආකාරයේ වැරදි තොරතුරු පැතිරවීම නීත්‍යානුකූලව මර්දනය කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පිළිගන්නෙමු. එසේ වුවද එවැනි අත්අඩංගුවට ගැනීම් නීති ප්‍රකාර විය යුතු අතර අත්තනෝමතික සහ අසමානුපාතික නොවිය යුතු මෙන්ම වෙනස්කමකින් තොරව සිදු කර යුතුය.

ඉහත සඳහන් අත්අඩංගුවට ගැනීම් පිලිබඳ අදාළ බී-වාර්තාවන් ඒවායෙහි නීතිමය පදනම ලෙස නොයෙකුත් පනත් සටහන් කරයි. ඒ අතරට දණ්ඩ නීති සංග්‍රහය (120 වගන්තිය), 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත (6 වගන්තිය), පොලිස් ආඥා පනත (98 වගන්තිය), නිරෝධායන ආඥා පනත (4 සහ 5 වගන්ති) සහ 2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනත (24 වගන්තිය) ඇතුලත් වේ.

නිරෝධායන ආඥා පනත සහ ආපදා කළමනාකරණ පනත ඒ සඳහා අදාළ කරගැනීමේ නීතිමය පදනම පහත දක්වා ඇති හේතූන් නිසාවෙන් ගැටළු සහගත බව අප විසින් පෙන්වා දීමට කැමැත්තෙමු;

නිරෝධායන ආඥා පනතේ 4 වන වගන්තිය අදාළ වන්නේ එම ආඥා පනත යටතේ පනවන ලද රෙගුලාසියක් කඩ කිරීමකට අදාලව පමණි. නොයෙකුත් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට පාදක වූ චෝදනා ලද ප්‍රකාශයන් නිරෝධයන ආඥා පනත යටතේ පනවා ඇති රෙගුලාසි උල්ලංඝනය කරන්නේ කෙසේද යන්නත්, එම ආඥා පනතේ යටතේ බලතල ඇති නිලධාරීන්ගේ රාජකාරී කටයුතුවලට බාධා පමුණුවන්නේ කෙසේද යන්නත් අපැහැදිලිය. ඒ හා සමානවම, ආපදා කලමණාකරන පනතෙහි 11 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත ආපදා අවස්ථාවක් රට තුළ ප්‍රකාශ කර නොමැති විටදී එම පනතේ 24 වන වගන්තිය අදාළ කර ගත හැකිද යන්නත් ගැටළු සහගතය.

එක් බී- වාර්තාවක් අත්අඩංගුවට පාදක වන නීතිමය පදනම කිසිසේත්ම සඳහන් කර නොමැත. මහජන සෞඛ්‍ය සහ මහජන සාමය මත ඍණාත්මක බලපෑමක් එල්ල කිරීමට හේතුවන ආකාරයේ වැරදි තොරතුරු පැතිරවීම මැඩපැවැත්වීමටනම් නීතීන් බලාත්මක කරන ආයතන විසින් ගන්නා ක්‍රියාමාර්ගයන් සඳහා ශක්තිමත් නීතිමය පදනමක් තිබිය යුතුය. එමෙන්ම අවංකවම සිදුවන අත්වැරදීම්, සද්භාවයෙන් හෝ පොදු යහපත උදෙසා සිදු කරන ප්‍රකාශයන් (උදාහරණ ලෙස ආයතනික අකටයුතුකම් හෙළිදරව් කරන්නන්ගේ ප්‍රකාශ), අකටයුත්තක් සිදුකිරීමේ පරමාර්ථයෙන් හිතාමතාම කරන ප්‍රකාශයන් හා ඉතා ප්‍රවේශමෙන් වෙනස් කොට හඳුනාගත යුතුය.

ඒ අනුව, වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම මත පදනම්ව මේ දක්වා සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම් නියමිත නීති ක්‍රියාවලියට අනුකූල වන්නේද යන්න සමාලෝචනය කිරීමටත්, අනාගතයේදී සිදු කරන අත්අඩංගුවට ගැනීම් සැබවින්ම නීති ප්‍රකාර බව තහවුරු කර ගත හැකිද යන්න තරයේ සැලකිල්ලට ගන්නා මෙන් අප නිර්දේශ කර සිටිමු.

2. සියලු විවේචනයන් වාරණයට ලක් කිරීම

රාජ්‍ය නිලධාරීන් විවේචනය කරන්නන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට අනතුරු අඟවමින් පොලිස් දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශය විසින් සියලුම මාධ්‍ය ආයතන වෙත නිකුත් කරන ලද ලිපිය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස දැඩි ලෙස වාරණයට අනිවාර්යයෙන්ම හේතු වන නිසාවෙන් එම ලිපිය මෙම කොමිෂන් සභාවේ දැඩි අවධාරණයට ලක් වී ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඕනෑම ප්‍රතිපත්තියක්, හෝ ඕනෑම රාජ්‍ය නිලධරයෙක් හෝ එම නිලධරයාගේ කාර්ය සාධනය පිලිබඳ අදහස් දැක්වීමට සහ එය විවේචනයටද ඇති නිදහස ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මූලික අංගයකි. පාලන ව්‍යුහය වැඩි දියුණු කරන්නෙත්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නෙත් අදහස් සහ විවේචන ඔස්සේය. මෙම මූලධර්මය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද විනිශ්චයන් සමූහයක් හරහා ස්ථිර ලෙස ස්ථාපිත වී ඇත ((ජෝසෆ් පෙරේරා එ. නීතිපති [1992] 1 ශ්‍රී.ල.නී.වා. 199 ; අමරතුංග එ. සිරිමල් [1993]1 ශ්‍රී.ල.නී.වා. 264).

එහෙයින් රාජ්‍ය නිලධාරීන් හෝ ප්‍රතිපත්තීන් හුදෙක් විවේචනය නිසාවෙන් සිදු කරන අත්අඩංගුවට ගැනීම් ව්‍යවස්ථානුකුල නොවන බව පෙන්වා දීමට අප කැමැත්තෙමු.

3. වෛරී ප්‍රකාශන

විවිධ ප්‍රජාවන් අතර සාමය සහ සහජීවනය ආරක්ෂා කිරීම සඳහා නීත්‍යානුකූලව වෛරී ප්‍රකාශන මැඩලීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හඳුනාගැනේ. වත්මන් සෞඛ්‍ය අර්බුධය ආශ්‍රිත කොටගෙන ආගමික බෙදීම් සහ වෛරය පැතිරවීමට උත්සාහ කරන්නන්ට එරෙහිව සිවිල් හා දේශපාලන අයිතීන් පිලිබඳ අන්තර්ජාතික සම්මුති පනතෙහි 3 වන වගන්තිය යටතේ ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලමින් අප විසින් 2020 අප්‍රේල් මස 03 දිනැතිව ඔබ වෙත ලිපියක් යොමු කරන ලදි.

ඊට පෙරදී, 2019 අගෝස්තු 28 දිනැතිව ඉහත වගන්තිය ක්‍රියාවට නැංවීමට අදාළ මාර්ගෝපදේශයන් මෙම කොමිෂන් සභාව විසින් ඔබ වෙත එවන ලදි. යම් පුද්ගලයකු අ.) ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය පැතිරවීමේ සහ ආ.) ඒ හරහා වෙනස් ලෙස සැලකීමට, එදිරිවාදිකම් වලට හෝ ප්‍රචණ්ඩක්‍රියා වලට මඟපෑදීමේ අභිප්‍රායක් තිබීමේ සාධාරණ සාක්ෂි පවතින අවස්ථාවකදී ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීති බලාත්මක කිරීමේ ආයතන බැඳී සිටින බව අප පෙන්වා දෙන ලදි.

එමෙන්ම, සියලුම ප්‍රජාවන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් වෙනස්කමකින් තොරව එම 3 වන වගන්තිය ක්‍රියාවට නැංවිය යුතු බවද මේ අවස්ථාවේ පෙන්වා දීමට කැමැත්තෙමු. එය එසේ නොවන විට නීතිය යම් ප්‍රජාවන්ට එරෙහි ආයුධයක් වන අතර, පාර්ලිමේන්තුව විසින් එම නීතිය පැනවීමේ අරමුණ එමඟින් පරාජය වේ.

එම වගන්තිය යටතේ මේ දක්වා සිදු කර ඇති අත්අඩංගුවට ගැනීම් නිරීක්ෂණය කිරීමේදී එම වගන්තිය වෙනස්කමකින් තොරව බලාත්මක කර ඇති බවට සාධාරණ නිගමනයකට එළඹීමට අපට නොහැක.

මෙම පෙර නොවූ විරූ සෞඛ්‍ය අර්බුධය හමුවේ මහජන සෞඛ්‍ය බලධාරීන් වෙත සහය දැක්වීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්යභාරය නැවත වරක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් ඉතා අගය කරන බව අවධාරණය කර සිටිමු. එහෙත්, පොලිස් දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ප්‍රශ්නසහගත ක්‍රියාමාර්ග හේතුවෙන් සිදුවන මානව හිමිකම් කඩවීම් පෙන්වා දීම මෙම කොමිෂන් සභාව සතු කාර්යභාරය වේ.

මෙම නිරීක්ෂණ සහ මාර්ගෝපදේශයන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බලතල සහ කාර්යභාරයන්ට අනුකූලව අප ඉදිරිපත් කරනු ලබන්නේ මානව හිමිකම් නීතිය කෙරෙහි විධායක සහ පරිපාලනමය අනුකූලතාවය තහවුරු කරගැනීමේ ඒකායන අරමුණ සහිතවය. ඉහත අවධාරණය කර ඇති ක්‍රියාවන් නැවත සමාලෝචනයට ලක් කොට මානව හිමිකම් හා අනුකූලතාවය තහවුරු වන ආකාරයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අප ඉල්ලා සිටිමු.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුරූපී පාලනය සහ නීතියේ ආධිපත්‍ය කෙරෙහි දැඩි විශ්වාසයකින් යුතුව මෙම අසීරු කාලවකවානුවෙන් අප ඉදිරියට යා යුතු බැව් අවධාරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙය අවස්ථාවක් කරගැනීමට කැමැත්තෙමු. නීතියෙන් බැහැරව එළඹෙන තාවකාලික විසඳුම් ප්‍රජාතන්ත්‍රවාදී පාලනය මත දීර්ඝ කාලීනව සෘණාත්මක බලපෑමක් එල්ල කිරීමට අනිවාර්යෙන් සමත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මෙන්ම අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් යටතේද හදිසි අවස්ථාවකදී වුවද මානව හිමිකම්වල සුරක්ෂිතභාවයට හෝ නීතියේ ආධිපත්‍යයට පටහැනි නොවන ආකාරයෙන් විශේෂ පියවර ගැනීමට හැකියාව ඇත. එම මාර්ගය අනුගමනය කිරීම අප රටේ ශක්තිය වනු ඇති බව නොඅනුමානය.

මහාචාර්ය ඩී. උඩගම
සභාපතිනිය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk